## මාධ්‍ය නිවේදනය

# ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා සුනිසි මෙහෙවර යථාර්ථයක් බවට පත් කිරීම

*2021 ජාත්‍යන්තර ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ දිනය. ලෝක කම්කරු සංවිධානයේ C189 සම්මතකර දස වසරක් සැපිරීම. කම්කරු නීති තුළ සර්වග්‍රහණය.*

2021 ජූනි මස 16 වැනි දින, කොළඹ දී - දස වසරකට පෙර අද වැනි දිනයක දී, ලෝකයේ රජයන්, සහ සේවායෝජකයින්ගේ හා සේවකයින්ගේ සංවිධාන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා සුනිසි මෙහෙවර පිළිබඳව වන අංක 189 දරන සම්මුතිය සහ අංක 201 දරන නිර්දේශය සම්මත කර ගත්හ. එතැන් පටන් මේ වනවිට රටවල් 32ක් මෙම C189 සම්මුතිය අපරානුමත කර ඇතත්, බොහෝ කාන්තාවන් සහ පුරුෂයින් ගෘහ සේවයේ නියැලෙන සහ බොහෝ සංක්‍රමණික ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සම්භවය වන දකුණු ආසියානු රටවල් අතරින් එකක් හෝ තවමත් මෙය අපරානුමත කර නොමැත.

2016 සිදුකළ ශ්‍රමබලකා සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ 80,000 ඉක්මවන ගෘහස්ථ ශ්‍රමිකයින් සංඛ්‍යාවක් සිටින අතර ඉන් 66,000කට වැඩි සංඛ්‍යාවක් කාන්තාවන් වේ. මෙතරම් පුළුල් ලෙස පැතිර සිටීමත්, ගෙදරදොරේ කටයුතු සහ රැකවරණය ලබාදීම සම්බන්ධයෙන් ඔවුන් ලබාදෙන දායකත්වයත් නොතකා, මෙම ශ්‍රමිකයින්ට නීතියෙන් ලැබෙන පිළිගැනීම අඩු අතර, අවිධිමත් ආර්ථිකයේ ශ්‍රම බලකායට අයත් පිරිසක් වශයෙන් ඔවුන් සැබැවින්ම ඇසට නොපෙනෙන මට්ටමක සිටින බව ILO වෙනුවෙන් Centre for Women’s Research විසින් 2020 දී සිදුකළ අධ්‍යයනයක සඳහන් වේ.

"වැඩිවශයෙන් ම කාන්තාවන් වන මෙම ශ්‍රමිකයින් සූරාකෑමට අතිශයින්ම අවදානම්පාත්‍ර කරවමින්, ශ්‍රී ලංකාවේ ගෘහසේවය කණගාටුදායක ලෙස පවතින්නේ කම්කරු නීතියේ පූර්ණ ආරක්ෂාව සහ විෂයපථයෙන් බැහැරවයි. මේ සම්බන්ධයෙන් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ILO C189 සහ R201 මගින් ප්‍රතිපත්තිවලින්, නීතියෙන් සහ ප්‍රායෝගිකව මේ ශ්‍රමිකයින් ආරක්ෂා කරගන්නේ කෙසේද කියා පැහැදිලි මාර්ගෝපදේශ ලබාදෙන අතරම, සමාජය හා ආර්ථික වෙත ඔවුන් ලබාදෙන අතිමහත් දායකත්වය පිළිගැනීමට ලක් කරනවා" යනුවෙන් ශ්‍රී ලංකාව සහ මාලදිවයින් සඳහා වන ILO කාර්යාලයේ අධ්‍යක්ශිකා සිම්රින් සිං මහත්මිය පැවසුවාය. "සැබැවින්ම, අපරානුමත කිරීම හරහා, ගෘහස්ථ ශ්‍රමිකයින් ද ඇතුළුව සියළුම ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම, නායකත්වය සහ විශ්වාසය පෙන්නුම් කෙරෙනවා ඇති"

ආසියාවේ සහ ශාන්තිකරයේ ගෘහස්ථ ශ්‍රමිකයින්ගෙන් සියයට 61.5ක් කම්කරු නීතියෙන් පූර්ණ වශයෙන්ම බැහැර වී සිටිති. අතිමහත් බහුතරයක් සාමාන්‍ය වැඩකරන පැය ගණන සම්බන්ධයෙන් සීමා සහ සතිපතා විවේකය සඳහා අයිතිය නොමැතිව වැඩ කරති. ගෙදරදොර වැඩකටයුතු සහ රැකවරණය සැපයීම අතින් ඔවුන් ලබාදෙන සුවිසල් දායකත්වය නොතකා, මෙම ගෘහස්ථ ශ්‍රමිකයින් සාමාන්‍යයෙන් උපයන්නේ පහළ ම මට්ටමේ වැටුප් ය. මෙම කලාපයේ අනෙකුත් ශ්‍රමිකයින් හා සමානව නීත්‍යානුකූල අවම වැටුපක් භුක්ති විඳින්නට හැකිව ඇත්තේ කලාපයේ ගෘහස්ථ ශ්‍රමිකයින් අතරින් සියයට 11කට පමණි. වැටුප් සහිත වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් කියන්නේ සියයට 19ක් පමණි. මේ, අද දිනයේ නිකුත් කරන ලද ILO ගෝලීය වාර්තාව වන, *ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා සුනිසි මෙහෙවර යථාර්ථයක් කිරීම: 2011 ගෘහස්ථ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් වන සම්මුතිය (අංක 189) සම්මත කර දස වසරකට පසු ලබාඇති ප්‍රගතිය සහ අනාගත අවස්ථා*

(*Making decent work a reality for domestic workers: Progress and prospects ten years after the adoption of the Domestic Workers Convention, 2011 (No. 189)*) නැමැති වාර්තාව හරහා සොයාගෙන ඇති කරුණු කිහිපයක් වේ.

## කම්කරු නීතිවලින් බැහැර කර තිබීම

ඓතිහාසිකව, ජාතික කම්කරු නීති හරහා ලැබෙන ආරක්ෂාවෙන් මෙම ගෘහස්ථ ශ්‍රමිකයින් බොහෝ දුරකට බැහැර කර තිබේ. නීතිය තුළ මෙන් ම ප්‍රායෝගිකව ද, ගෘහ සේවය යන්න සැබෑ මෙහෙවරක් වශයෙන් හඳුනානොගැනීමක් මෙයින් පිළිබිඹු වේ. මේ හේතුවෙන්, ගෘහස්ථ මෙහෙවර නීතියෙන් පිළිගැනීමට ලක් කළයුතුය යන කාරණය ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ ප්‍රධානතම ඉල්ලීමක් වී තිබේ.

## අඩු වේතන සහ ගෘහස්ථ ආදායම

ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සංවිධාන දෙකක් විසින් කොළඹ, ගම්පහ, මහනුවර, සහ නුවරඑළියේ සිදුකළ සමීක්ෂණයකට අනුව, ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ශ්‍රමිකයකුගේ සාමාන්‍ය මාසික ආදාරම රු. **15,940**ක් වේ. එම නියැදියෙන් සියයට **94**ක් සඳහන් කර තිබුණේ ගෘහසේවයේ නියැළීම තමන්ගේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන බවයි. ගෘහස්ථ ශ්‍රමිකයින් අතරින් සියයට **78**කට තමන්ගෙන් යැපෙන්නන් **3** සිට **4** දක්වා සංඛ්‍යාවක් සිටිති. සියයට **67**ක් තමන්ගේ කුටුම්භයේ එකම හෝ ප්‍රධානතම ආදායම් උපයන්නා වේ.

## සීමිත සමාජ ආරක්ෂණය

කෝවිඩ්-**19** තත්වය තුළ ශ්‍රී ලංකාවේ විරැකියා රක්ෂණ හෝ ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ලබාදෙන ආදායම් උපකාර නොමැති පසුබිමක ඉහත සමීක්ෂණයට සම්බන්ධ වූ නියැදියෙන් සියයට **70**ක් ම සඳහන් කර තිබුණේ තමන්ගේ සහ තම පවුල්වල සෞඛ්‍ය තත්වයට ඇතිවන අවදානම ගැන සිතා නිවසේ රැඳී සිටිනවාට වඩා සේවයට යාම තමන්ට වැදගත් වන බවයි.

"අවිධිමත් අංශයේ සිටින ශ්‍රමිකයින් සම්බන්ධයෙන් අපගේ ප්‍රධානම අරමුණ වන්නේ, මෙම ශ්‍රමිකයින් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාගතහැකි කිරීමත් ඔවුන්ට සුභසාධන සහ වඩාත් හොඳ සේවා කොන්දේසි සලසාදීමත් වනවා" යනුවෙන් ප්‍රොටෙක්ට් යුනියන් සංවිධානයේ කල්ප මධුරංග මහතා පැවසී ය.

## සේවාස්ථානයේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් අවදානම්

ගෘහස්ථ ශ්‍රමිකයින් රසායනික ද්‍රව්‍ය, ශ්‍රමක්ෂමතා (ergonomic) සහ ශාරීරික උපද්‍රව සඳහා අවදානම්පාත්‍ර වන අතර කාන්තාවන් විශේෂයෙන් ම ප්‍රචණ්ඩත්වයට සහ අතවර සඳහා අවදානම්පාත්‍ර වේ. ඔවුන් වැඩ කරන්නේ තවත් පුද්ගලයකුගේ නිවෙසක වන බැවින් උස් තාප්ප සහ වැසුනු දොරවල් පසුපස ඔවුන් සිටින්නේ නොපෙනෙන තත්වයක වේ. ඔවුන්ගේ සේවා ස්ථානය පරීක්ෂාවට ලක් වීමක් හෝ හදිසි අනතුරු හෝ අසනීප ඇතිවීම හේතුවෙන් ඔවුන්ට ශ්‍රමිකයින්ට ගෙවන වන්දි අදාළ කරගැනීමක් හෝ සිදු නොවේ.

## කෝවිඩ්-19 වසංගතය මගින් අවදානම්පාත්‍රතාවය උග්‍ර කරවීම

දැනට පවතින කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් වඩාත් බරපතළ ලෙස ම පීඩාවට ලක් වූ කොටස් අතරට ගෘහස්ථ ශ්‍රමිකයින් ඇතුළත් වේ. වැඩි ගෘහස්ථ ශ්‍රමිකයින් සංඛ්‍යාවකට තමන්ගේ රැකියා අහිමි වී ගොස් ඇත, නැතහොත්, අනෙකුත් ශ්‍රමිකයින්ට සාපේක්ෂව තමන්ගේ වැඩකරන පැය සංඛ්‍යාව බෙහෙවින් අඩුවීමකටත්, ඊට සමගාමීව තමන්ගේ වේතන අඩුවීමකටත් ලක් වී තිබේ. ILO සමගින් එක් වී ප්‍රොටෙක්ට් යුනියන් සහ ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ වෘත්තීය සමිතිය මෑතක දී සිදුකළ සමීක්ෂණයකට අනුව කෝවිඩ්-19 හේතුවෙන් 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ, තමන් වැඩකරන නිවසේ ම නතර නොවී ගෘහ සේවයේ නියැළෙන ශ්‍රමිකයින් අතරින් සියයට 70කට රැකියාව සහ ආදායම අහිමි වී ඇත.



කෝවිඩ්-19 වසංගතයත් සමගින්, අදාළ නිවසේම නැවතී සේවය කරන ගෘහස්ථ ශ්‍රමිකයින් එම නිවෙස්වලටම කොටු වී තිබේ. ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සංවිධානවලට අනුව, ලොක්ඩවුන් තත්වය සහ පළාත් අතර සංචරණයට සීමා පැනවීම මත දීර්ඝ කාලයක් තිස්සේ තමන්ගේ පවුලේ අයගෙන් වෙන් වී සිටින්නට සිදුවීමෙන් ඇතැම් අය මානසික සහ මනෝසාමාජීය ගැටළු අත්විඳ තිබේ.

කෙටිකාලීනව ගෘහස්ථ ශ්‍රමිකයින් ආරක්ෂා කරගැනීම සඳහා කෝවිඩ්-19 මාර්ගෝපදේශ සම්බන්ධයෙන් පුහුණු සහ දැනුවත්භාවය ලබාදීම, පුද්ගලාරක්ෂක උපකරණ (PPE) ලබාදීම, සහ වසංගත තත්වය තුළ රැකියාවේ සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් සහතිකවීම අවශ්‍ය වේ.

"මේ අත්‍යාවශ්‍ය ශ්‍රමිකයින්ට ලැබිය යුතු ආරක්ෂාව සහ ගරුත්වය ලැබෙන බව සහතික කරගැනීම සඳහා, කම්කරු සහ සමාජ ආරක්ෂණ නීතිවලට ගෘහ සේවය ඇතුළත් කිරීමෙන් ආරම්භ වී, ආසියා ශාන්තිකර කලාපයේ ගෘහ සේවය විධිමත් කිරීම සඳහා කඩිනම් අවශ්‍යතාවයක් පවතිනවා," යනුවෙන් ILO සහකාර අධ්‍යක්ෂ ජෙනරාල් සහ ආසියා හා ශාන්තිකර කලාපයේ කළාපීය අධ්‍යක්ෂිකා චිහොකො අසදා මියකාවා මහත්මිය පැවසුවා ය.

## සංස්කාරකවරුන් සඳහා සටහන්

## ලෝක කම්කරු සංවිධානය පිළිබඳව යමක්

ලෝක කම්කරු සංවිධානය යනු වැඩ ලෝකය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂඥ නියෝජිතායතනයයි. එහි සාමාජිකත්වය ත්‍රෛපාර්ශවීය වේ. එනම් ඊට රාජ්‍යයන් ද, සේවායෝජකයින්ගේ සංවිධාන ද, ශ්‍රමිකයින්ගේ සංවිධාන ද අයත්වන අතර ඔවුන් එක්ව කම්කරු ප්‍රමිතීන් ඇති කිරීම, ශ්‍රම වෙළඳපල ප්‍රතිපත්ති සංවර්ධනය, සහ කාන්තාවන් හා පුරුෂයින් සඳහා සුනිසි මෙහෙවර ඇතිකිරීමට වැඩසටහන් සැලසුම්කරණය සිදුකරනු ලැබේ.

*ලෝක කම්කරු සංවිධානය (2021), ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා සුනිසි මෙහෙවර යථාර්ථයක් කිරීම: 2011 ගෘහස්ථ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් වන සම්මුතිය (අංක 189) සම්මත කර දස වසරකට පසු ලබාඇති ප්‍රගතිය සහ අනාගත අවස්ථා*

*ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ වෘත්තීය සමිතිය සහ ප්‍රොටෙක්ට් යුනියන් සහ ලෝක කම්කරු සංවිධානය (2020), ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ශ්‍රමිකයින් මත කෝවිඩ්-19 මගින් ඇතිකෙරෙන බලපෑම පිළිබඳ කඩිනම් ඇගැයුම*

*ලෝක කම්කරු සංවිධානය (2020), ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ශ්‍රමිකයින් සහ සුනිසි මෙහෙවර*

## වැඩිදුර විස්තර සඳහා:

කරුණාකර asitha@ilo.org හරහා ශ්‍රී ලංකාව සහ මාලදිවයින් සඳහා වන ILO කාර්යාලයේ අසිත සෙනවිරත්න මහතා සමගින් සම්බන්ධ වන්න.